# ජනදිරිය අරමුදල 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ලැබිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 1996 වර්ෂයේ සිට පැවත එන ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.337,447ක් අයකර ගැනිමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගිණම් විෂයයන්වලට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---:|---|
| (i) ස්ථාවර වත්කම් | 78,571,052 | විස්තරාත්මක උපලේඛනය හා සත්‍යාක්ෂණ වාර්තා |
| (ii) සුළු මුදල් අග්‍රිමය | 12,141 | සුළු මුදල් පොත |
| (iii) ලැබිය යුතු කුලී ආදායම | 231,553 | කුලී ගිවිසුම් |
| (iv) ආරක්ෂක තැන්පතු | 10,000 | තැන්පතු සහතික |

(අ) අරමුදලේ ස්ථාවර වත්කම් පිළිබඳ සොයා බැලීම සඳහා 2008 සැප්තැම්බර්18 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජොෂ්ඨ සහකාර ලේකම් (පාලන) ගේ සහභාගීත්වයෙන් යුත් කමිටුවක් පත් කර තිබූ අතර 2008 දෙසැම්බර් 30 දිනැති කමිටු වාර්තාව අනුව වත්කම් නිශ්චිතව හඳුනා නොගෙන පහත සඳහන නිරීක්ෂණයන් දක්වා තිබුණි.

| විස්තර | 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම | කමිටුවේ නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| ඉඩම් | 56,912,300 | ජනකලා කේන්ද්‍රය ඉදිකර ඇති භූමිය විය යුතුය. |
| ගොඩනැගිලි (පිරිවැයට) | 20,502,475 | ජනකලා කේන්ද්‍ර ගොඩනැගිල්ල විය යුතුය. |
| ලී බඩු සහ උපකරණ | 746,090 | ජනකලා කේන්ද්‍රයේ ස්ථානගත කර තිබිය යුතුය. |
| කාර්යාල උපකරණ | 333,250 | -එම- |
| නේවාසිකාගාර සහ මුළුතැන්ගෙයි උපකරණ | 76,937 | -එම- |

2012 පෙබරවාරි 16 දින ඉහත සඳහන් වත්කම් සම්බන්ධව සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී අරමුදලට අයත් වත්කම් කිසිවක් ජනකලා කේන්ද්‍රය සතුව නොතිබූ බව විගණනයට අනාවරණය විය.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2009 අංක 68 දරන ගාමෝදය මණ්ඩල අරමුදල(සංශෝධන) පනත මගින් සංශෝධිත 1982 අංක 28 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනතේ 7(2)(උ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය පාලනය හා එයට අදාල ගිණුම් කාර්ය පටිපාටි සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් අදාල පරිදි රෙගුලාසි සම්පාදනය කළ යුතු වුවද, 2012 වර්ෂය අවසානය දක්වාත් එම කටයුතු සිදුකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.316,366 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,047,514 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,363,880 කින් හෙවත් සියයට 115 කින් පිරිහී තිබුණි. රු.316,366 ක ස්ථාවර වත්කම් ක්ෂයවීම් ගැලපීම හැරුණුවිට වෙනත් කිසිඳු ගනුදෙනුවක් සමාලෝචිත වර්ෂය තුළ සිදු වී නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **අරමුදල අක්‍රීයව පැවතීම**

---------------------------

1982 අංක 28 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනතේ 6 වන වගන්තිය අනුව ග්‍රාමෝදය මණ්ඩල වෙත පවරනු ලැබූ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේදී යම් ග්‍රාමෝදය මණ්ඩලයක් විසින් ආරම්භ කරන ලද යම් වැඩක් හෝ ව්‍යාපෘතියක් කරගෙන යාම සඳහා ඒ ග්‍රාමෝදය මණ්ඩලයට මූල්‍ය හා අනෙකුත් ආධාර ප්‍රදානය කිරීම අරමුදලේ පරමාර්ථය විය. 1996 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වර්ෂ 16 ක් මෙහෙයුම් කටයුතු කිසිවක් ඉටු නොකර අරමුදල මුළුමනින්ම අක්‍රීයව පැවතුණි. අරමුදලේ මෙහෙයුම් කටයුතු අවසන් කර අරමුදලේ මුදල් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලෙස රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ජනවාරි 07 දිනැති අංක පීඑෆ්/එෆ්ඩී/04/21-වීඕඑල්-ii දරන ලිපියේ සඳහන් උපදෙස් පරිදි අරමුදලේ පැවති රු.165,806,672 ක් වූ සම්පූර්ණ මුදලම ඉකුත් වර්ෂය තුළ මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.

4. **පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් පාලනය

(ආ) මූල්‍ය කළමනාකරණය

එෆ්බී/ඒ/ජේඑෆ්/එෆ්ඒ/12 2013 ඔක්තෝබර් දින.

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව.

**ජනදිරිය අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

වැඩබලන විගණකාධිපති

පිටපත - ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය